## 2557 - මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013

**3 ශ්‍රේණිය** **(09) සෞඛ්‍ය විද්‍යාව** **පැ තුනයි**

* I කොටසේ ප්‍රශ්න සියල්ලටත්, II කොටසින් තෝරාගත් ප්‍රශ්න **හතරකටත්** පිළිතුරු ලියන්න.

### I කොටස

(01) (i) මිනිස් සිරුරේ මූලික තැනුම් ඒකකය කුමක් ද?

(ii) ජීර්ණය වූ ආහාර අවශෝෂණය වීමට ක්ෂුද්‍රාන්තය තුළ විශේෂ හැඩ ගැසීම් 2 ක් ලියන්න.

(iii) රුධිර සෛල බෙදිය හැකි කොටස් 04 ලියන්න.

(iv) දුම්පානය නිසා සමාජයට වන හානි 2 ක් සඳහන් කරන්න.

(v) දරුවෙකුගේ මුඛයේ ඇති කිරිදත් ගණන හා වැඩුණු පුද්ගලයෙකුගේ මුඛයේ ඇති ස්ථිර දත් ගණන වෙන වෙන ම ලියන්න.

(vi) මානසික සෞඛ්‍යය ආරක්ෂා කර ගැනීමට බුදු දහමින් පෙන්වා දී ඇති ක්‍රම 2 ක් ලියන්න.

(vii) සම මගින් සිදුවන සේවාවන් 2 ක් ලියන්න.

(viii) මදුරුවා හැරුණුවිට මිනිසාට රෝග බෝකරන වෙනත් සතුන් දෙදෙනෙක් නම් කරන්න.

(ix) මිනිස් සිරුරේ සිදුවන පරිවෘත්තීය ක්‍රියාවලින් සෑදෙන මිනිසාට අහිතකර ද්‍රව්‍ය 2 ක් ලියන්න.

(x) අපේ සෞඛ්‍යට බලපාන අභියෝග තුනක් සඳහන් කරන්න. **(ලකුණු 4×10 = 40)**

### II කොටස

(02) රුධිර සංසරණ පද්ධතියේ සරල රූප සටහනක් පහත දැක්වේ. එය හඳුනාගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) A, B, C, D, E, F යන කොටස් නම් කරන්න. (ල. 06)

(ii) මිනිස් රුධිර සංසරණයේ කොටස් කීය ද? ඒවා මොනවා ද? (ල. 03)

(iii) රුධිර සංසරණ පද්ධතියට වැළඳෙන රෝග 03 ක් ලියන්න. (ල. 06)

(03) (i) සිරුරෙන් බැහැර ලන ප්‍රධාන බහිස්ස්‍රාවී ද්‍රව්‍ය 3 ක් ලියන්න. (ල. 03)

(ii) ශරීරයේ බහිස්ස්‍රාවී පද්ධති අතුරින් වැඩිම නිෂ්ප්‍රයෝජන ද්‍රව්‍ය ප්‍රමාණයක් බැහැර ලන පද්ධතිය කුමක් ද? (ල. 02)

(iii) එහි ප්‍රධාන කොටස් 04 ක් නම් කරන්න. (ල. 04)

(iv) මුත්‍රා පද්ධතියට වැළඳිය හැකි රෝග 03 ක් නම් කර ඒවායින් ආරක්ෂාවීමට ගතයුතු පියවර 3 ක් ලියන්න. (ල. 06)

(04) (i) මිනිසාගේ සෞඛ්‍ය රැක ගැනීමට බුදු දහම ඉවහල් වන ආකාරය පැහැදිළි කරන්න. (ල. 08)

(ii) ප්‍රථමාධාර යන්න පැහැදිලි කරන්න. (ල. 04)

(iii) ගිලනුන්ට උපස්ථාන කරන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග 05 ක් බුදු දහමේ පෙන්වා දී ඇත. එයින් 03 ක් ලියන්න. (ල. 03)

(05) පහත දැක්වෙන මාතෘකාවලින් 03 ක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(i) බෝ නොවන රෝග

(ii) භාවනා කිරීමෙන් කායික සුවයක් ලැබේ.

(iii) දේශීය වෛද්‍ය ක්‍රමය

(iv) සුදු රුධිරාණු

(v) නිරෝගිමත් ජීවිතයකට අනුගමනය කළයුතු සෞඛ්‍ය පුරුදු (ල. 15)

(06) (i) අහාරයක අඩංගු විය යුතු පෝෂණ කොටස් 5 ක් නම් කරන්න. (ල. 05)

(ii) මුඛයේ අඩංගු ප්‍රධාන දත් වර්ග 4 නම් කර දත් ආරක්ෂා කර ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ල. 05)

(iii) ආහාර ජීර්ණ පද්ධතිය ආරක්ෂා කර ගැනීමට ගතයුතු පියවර විස්තර කරන්න. (ල. 05)

(07) (i) ශ්වසන පද්ධතිය මගින් සිරුරේ සිදු කරන කාර්යය විස්තර කරන්න. (ල. 05)

(ii) පෙනහලු තුළ වායු හුවමාරුව වඩාත් කාර්යක්ෂම අයුරින් සිදුවීමට හැඩ ගැසී ඇති අයුරු පැහැදිලි කරන්න. (ල. 05)

(iii) ස්වසන පද්ධතියට වැළඳෙන රෝග සඳහන් කරන්න. (ල. 05)